## ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය - 2012

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2012 වර්ෂය තුළ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් තුනක් වෙනුවෙන් රජයෙන් හා ඇඟළුම් කර්මාන්ත ශාලාවලින් පිළිවෙලින් රු.18,443,072 ක් හා රු. 486,176 ක් වශයෙන් රු. 18,929,248 ක් ලැබී තිබුණි. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් කළ පසු රු. 2,695,058 ක ඉතිරියෙන් නිශ්චිත ප්‍රතිශතයක් ලාභයට බැර කිරීම වෙනුවට එම මුළු ඉතිරියම ලාභයක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි දක්වා තිබුණි.

(ආ) මෝටර් වාහන 3ක් මිලදී ගැනීම සඳහා රු.1,102,250 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල එය අත්තිකාරම් ලෙස දක්වා නොතිබුණු අතර, සදොස් ලෙස අනිකුත් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

1.2.2 **ලැබිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවාවන් ණයට සැපයීමෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.25,798,386 කින් රු. 3,261,651 ක් වසර 2 කට වැඩි කාල පරිච්ඡේදයක සිට හිඟ හිටව තිබූ අතර, මෙම ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් කයාකාර් වැඩපිළිවෙලක් ආයතනය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඇඟළුම් ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන ඇඟළුම් නිෂ්පාදන ආයතනවලින් මසකට රු. 5,000 බැගින් අයකර ගත යුතු වුවත්,

ආයතන 13 කින් රු. 165,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| වෙළඳ ණයගැතියන් | 25,690,543 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| ස්ථාවර වත්කම් | 121,198,803 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |

1.2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ** 3 (1) වගන්තිය | ආයතනයේ පාලක මණ්ඩල සංයුතිය 12 දෙනෙකු විය යුතු වුවත්, 2012 වර්ෂය අවසාන වන විටත් පාලක මණ්ඩල සංයුතිය 9 දෙනෙකුට පමණක් සීමා වී තිබුණි. |
| **(ආ) ආයතන සංග්‍රහයේ** 6 වන පරිච්ඡේදයේ 2.1 වගන්තිය | එක් එක් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල චර්යා සටහනක් පවත්වා නොතිබුණි. |

### 1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය ආයතනයකින් ලැබිය යුතුව තිබුණු රු.1,186,671 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගිණුම්වලින් කපා හැර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.6,209,102 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ (නැවත සකසන ලද Restated) අතිරික්තය රු.13,935,340 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,726,238 ක පිරිහීමක් වූ අතර, ඒ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.12,670,107 කින් පමණක් වැඩි වී තිබුණත්, පරිපාලන, ගිවිසුම්ගත සේවා හා වෙනත් මෙහෙයුම් වියදම් එකතුව රු. 21,390,847 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තබුණි. කෙසේ වෙතත් මෙම වාර්තාවේ 1.2.1 හි සදොස් ලෙස දැක්වෙන රු. 2,695,058 ක ලාභය ඉවත් කළේ නම් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවේ.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීමද, පරීක්ෂණ හා උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීමද මෙම ආයතනයේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සාධනය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| කාර්යය | 2012 | 2011 | සමාලෝචිත වර්ෂයේ වැඩිවීම | වැඩිවීම හා අඩුවීම ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| පුහුණු කිරීම් | | | | |
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 157 | 119 | 38 | 32 |
| සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 3903 | 1790 | 2113 | 118 |
| පුහුණු පාඨමාලා ආදායම (රු.මිලියන) | 34.58 | 24.56 | 10.02 | 41 |
| පරීක්ෂණ | | | | |
| පරීක්ෂණ සංඛ්‍යාව | 50,105 | 43,864 | 6,241 | 14 |
| පරීක්ෂණ ආදායම (රු.මිලියන) | 47.28 | 43.94 | 3.34 | 8 |
| උපදේශාත්මක සේවා | | | | |
| උපදේශාත්මක සේවා සංඛ්‍යාව | 20 | 18 | 2 | 11 |
| උපදේශාත්මක සේවා ආදායම (රු. මිලියන) | 2.31 | 4.02 | (1.71) | (43) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දින දක්වා පැවැත්වීමට සැලසුම් කර තිබූ පූර්ණකාලීන හා සති අන්ත පාඨමාලා 41 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණ අතර, එම නිසා සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා පැවැත්වීමෙන් ලබාගත හැකිව තිබූ රු. 10,723,000 ක ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව සියයට 14 කින් ඉහළ ගොස් තිබුණත්, එයට සාපේක්ෂව ආදායමේ වැඩිවීමේ ප්‍රතිශතය සියයට 7.6 ක වී තිබුණි.

(ඇ) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී උපදේශාත්මක සේවා සංඛ්‍යාව 2 කින් වැඩි වී තිබුණද, ඊට සාපේක්ෂව ආදායම සියයට 42.5 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

(ඇ) ආයතනය විසින් සම්මන්ත්‍රණ පැවැත්වීම බාහර පාර්ශවයනගේ ඉල්ලුම මත සිදුකරන අතර, සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් කිසිදු සම්මන්ත්‍රණයක්වත් පවත්වා නොතිබුණි. කෙසේ නමුත්, ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා අදාල සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ක්ෂේත්‍රයේ නියුතු වූවන් අතර ප්‍රවර්ධන වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම ආයතනයේ ප්‍රධාන වගකීමක් වුවද, කළමනාකාරීත්වය ඒ සඳහා අවධානය යොමු කර නොතිබුණි.

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාද දඩ ලෙස රු.895,698ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය තුළ ස්ථාපිත කර ඇති පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථානය සඳහා පරිගණක යන්ත්‍ර 24 ක්, මුද්‍රණ යන්ත්‍ර 2 ක් හා අන්තර්ජාල පහසුකම් සපයා තිබුණත්, සුදුසුකම්ලත් පරිගණක උපදේශකවරයෙක් අනුයුක්ත කර නොතිබීම නිසා පාඨමාලා විධිමත්ව පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ආ) ආයතනය සතු ඩීසල් ටැංකියක් අලුත්වැඩියා කිරීම සඳහා 2012 සැප්තැම්බර් 27 දින රු.109,920 ක් වැයකර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ටැංකිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) ආයතනය විසින් 2009 වර්ෂයේදී වෑන් රථයක් රේගුවෙන් නිදහස් කර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් එකතුව රු. 2,601,175 ක් වැයකර තිබුණද, එම වාහනය 2013 මාර්තු 31 දින වන විටත් ධාවන තත්ත්වයේ නොතිබුණි.

3.4 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

3.4.1 <u>ඉංජිනේරු වැඩ ගොඩනැගිල්ල ඉදිකිරීම</u>

(අ) ඉහත සඳහන් ගොඩනැගිල්ල ඉදිකිරීමේ පිරිවැය ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 8,966,702 ක් වී තිබුණි. 2010 මැයි 03 දින එම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. 5,361,615 කට පිරිනමා තිබූණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2010 අගෝස්තු 31 දිනට පෙර නිමකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාර අදාල ප්‍රමාද ගාස්තු අයකිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු මුල් ඇස්තමේන්තුව, අවස්ථා 02 කදී එකතුව රු.1,515,034කින් වැඩිකර තිබුණි. මෙය මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 28 ක් වී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් කරන ලද සහතික කරන ලද වැඩවල වටිනාකම රු.5,633,389 ක් වුවද, ගෙවන ලද මුදල් ප්‍රමාණය රු. 5,816,137 ක් වීම නිසා කොන්ත්‍රාත්කරුට රු. 182,748 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4.2 <u>ආයතනයේ පන්ති කාමර, සම්මන්ත්‍රණ කාමර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාමරය හා රෙදි විරීම් කාමර වෙන්කිරීම</u>

ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව රු. 3,252,646 ක මුදලකට 2012 නොවැම්බර් මස පිරිනමා තිබූ අතර, මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඉහත කොන්ත්‍රාත්තුව 2013 ජනවාරි 31 දින වන විට සම්පූර්ණ කර භාරදිය යුතු වුවද, 2013 අප්‍රේල් 10 දින වන විටත් වැඩ නිමකර නොතිබූණි. එදිනට දින 69 ක් වෙනුවෙන් අයකළ යුතුව තිබූ රු.112,216 ක් වූ ප්‍රමාද දඩ අයකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු වෙත ආයතනය විසින් මීට පෙර පිරිනමන ලද කොන්ත්‍රාත් නියමිත කාලය තුළ අවසන් කර භාරදී නොතිබියදීත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්කරුගේ අතීත කාර්ය සාධනය නොසලකා මෙම කොන්ත්‍රාත්තුවද ඔහුට පිරිනමා තිබුණි.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය පනතින් ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත හා අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානය ඒකාබද්ධ කර 2009 සැප්තැම්බර් 01 දින සිට පේෂකර්ම හා ඇඟළුම් ආයතනය ලෙස අලුතින් පිහිටුවා තිබුණි. මෙලෙස ඒකාබද්ධ කර තිබුණද, අලුතින් පිහිටුවන ලද ආයතනයේ නිලධාරීන් ඇතුළු සේවක මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නව පත්වීම් ලිපි ප්‍රදානය කොට නොතිබුණි.

(ආ) ආයතනය විසින් අනුමත කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් පරිපාටි සකස් කොට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබුණු අතර, ප්‍රතිව්‍යුහකරණය යටතේ යෝජිත බඳවා ගැනීම් පරිපාටිය, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කොට නොතිබුණි.

(ඇ) 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනතේ 12 (1) වන වගන්තිය මගින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව සහ දැනුම වර්ධනය කිරීමේ කාර්යය සඳහා ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් පිහිටවිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් පිහිටුවා නොතිබුණි.

## 3.6 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

2012 දෙසැම්බර් 31 දිනට පාර්තෝෂික ප්‍රතිපාදන ගිණුමේ රු. 26,145,564 ක් වූ මුදල අනාගත වගකීම් සඳහා ආයෝජනය කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

ආයතනයේ කාර්ය මණ්ඩලය 100 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ආදායම සහ වියදම රු. මිලියන 100 ඉක්මවා තිබුණද ආයතනය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණ. එහෙයින් ආයතනයේ කිසිදු ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා (ආ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආයතනය විසන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ලැබිය යුතු ගිණුම්
(ආ) තොග හා වත්කම් පාලනය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්